www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මූලික එල්ටීටීඊ ප්‍රහාර දෙකකට පසුව ශ්‍රී ලංකාවේ මිලිටරි ගැටුම් උත්සන්න වේ

## Military conflict escalates in Sri Lanka after two major LTTE attacks

**සරත් කුමාර විසිනි**
**2006 ඔක්තෝබර් 19**

පසු ගිය ජුලි මස සිට පැන නැග ඇති විවෘත සිවිල් යුද්ධය තව දුරටත් උත්සන්න වීමේ අන්තරාය මතු කරමින්, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පසු ගිය දින තුන තුල ශ්‍රී ලංකා මිලිටරියට එරෙහිව මූලික ප්‍රහාර දෙකක් එල්ල කලේ ය.

සඳුදා කොලඹ අගනුවර සිට කිලෝ මීටර් 170ක් පමන ඊසාන දෙසින් පිහිටි හබරන දී එල්ල කෙරුනු මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් අඩු ගනනේ 102ක් ඝාතනයට ලක්ව 150කට වැඩි සංඛ්‍යාවකට තුවාල සිදු විය. ඔවුන්ගෙන් වැඩි දෙනා නාවික භටයන් ය. එම ස්ථානය නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමලය වරාය නගරයේ පිහිටි නාවික හා යුද හමුදා කඳවුරුවලට යන හා ඒවායේ සිට එන නාවික භටයන් හා සොල්දාදුවන් මාරු වන ස්ථානයකි.

මරා ගෙන මැරෙන බෝම්බකරුවෙක් 350කට ආසන්න නාවික භටයන් ප්‍රවාහනය කරන බස් රථ 20ක් පමන නවතා තිබූ ස්ථානයක් තුලට පුපුරන ද්‍රව්‍ය පටවන ලද ට්‍රක් රියක් පැදවී ය. ඔවුන් නිල වසයෙන් වගකීම භාර ගෙන නැතත්, මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාර පිලිබඳ දිගු කාලීන ඉතිහාසයක් ඇති එල්ටීටීඊය මෙම ප්‍රහාරය සිදු කල බවට මුලුමනින් ම පාහේ ඉඩ ඇත.

ඊයේ, පුපුරන ද්‍රව්‍ය පැටවූ බෝට්ටු ඇතුලු එල්ටීටීඊ බෝට්ටු පහක් දකුනු පලාතේ ගාල්ල නගරයේ ප්‍රධාන නාවික කඳවුරට පහර දුනි. ඒ පිලිබඳ විස්තර තවමත් පැහැදිලි නැති නමුත් නාවික යාත්‍රා දෙකකට හානි සිදු වූ බව පෙනී යයි. මිලිටරියට අනුව, ගැටුමේ දී නාවික භටයන් දෙදෙනෙක් මිය ගොස් සිවිල් වැසියන් කිහිප දෙනෙකු ඇතුලු තවත් 26කට තුවාල සිදු විය. කැරලිකරුවන් 15 දෙනාම මරුමුවට පත් විය.

කොලඹ ආන්ඩුව වහාම මෙම ප්‍රහාර හෙලා දුටුවේ ය. ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල හබරන බෝම්බ ප්‍රහාරය "ම්ලේච්ඡ ත්‍රස්තවාදී ප්‍රහාරයක්" ලෙස නම් කලේ ය. "එල්ටීටීඊ න්‍යාය පත්‍රයට සාමය ඇතුලත් නොවන බවත් ඔවුන් ජාත්‍යන්තර මතය ගැන කිසිදු තැකීමක් නොදක්වන බවත් එය පැහැදිලිව පෙන්නුම් කරයි."

මිලිටරිය ඊස්රායලයේ තනන ලද කෆීර් ජෙට් යානා යොදා ගෙන එල්ටීටීඊ පාලිත ප්‍රදේශවලට ගුවන් ප්‍රහාර එල්ල කරමින් ප්‍රතිචාර දැක්වී ය. එම යානාවලින් එකක් අහසට නංවා මද වේලාවකින් කඩා වැටුනි. එල්ටීටීඊ වාර්තාවලට අනුව, එල්ටීටීඊ ගුවන් විදුලි මධ්‍යස්ථානයට හා සම්ප්‍රේශන කුලුනට සහ තවත් ඉලක්කවලට එල්ල කල ගුවන් ප්‍රහාරවලින්, කුඩා ගැහැනු දරුවන් දෙදෙනකු ඇතුලු සිවිල් වැසියන් ගනනාවක් ඝාතනයට හා තුවාලවලට ලක් විය. ගාල්ලේ ගැටුමෙන් පසුව ද ඊයේ තවත් ගුවන් ප්‍රහාර ගනනාවක් සිදු කෙරුනි.

ගැටුම් සිදු වන්නේ ඔක්තෝබර් 28-29 දිනවල ජිනීවාහි පැවැත්වීමට නියමිත සාම සාකච්ඡා සඳහා සූදානම් වන අතරතුර ය. ජපානයේ විශේෂ නියෝජිත යෂූෂි අකාෂි ජනාධිපති මහින්ද රාජපක්ෂ හමුවීම සඳහා සඳුදා කොලඹට පැමිනි අතර නෝර්වේ නියෝජිත ජෝන් හැන්සන් බවර් සහ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර් මේ සතියේ ශ්‍රී ලංකාවට පැමිනීමට නියමිත ය.

සිදු වන සාකච්ඡාවක දී එල්ටීටීඊයට පීඩනය යොදනු පිනිස මහ බලවතුන්ගේ සහාය ගොනු කර ගනු වස් මෑතම ප්‍රහාර ගසාකෑමට රඹුක්වැල්ල සහ සෙසු ප්‍රකාශකයෝ උත්සාහ කරති. එහෙත් යුද්ධය උත්සන්න වීම පිලිබඳ ප්‍රධාන වගකීම මුලුමනින් ම පැවරෙන්නේ, ජුලි මස එල්ටීටීඊ භූමි ප්‍රදේශය තුල පිහිටි මාවිල්ආරු සොරොව්ව අල්ලා ගනු පිනිස ප්‍රධාන මෙහෙයුමක් දියත් කල, රාජපක්ෂ ආන්ඩුව මත ය. එම ප්‍රහාරය 2002 සටන් විරාමය පැහැදිලිව ම උල්ලංඝනය කිරීමකි.

හබරන "ත්‍රස්තවාදී ක්‍රියාව" පිලිබඳ රඹුක්වැල්ලගේ කෝපයත් සාම සාකච්ඡාවලට සහාය දෙන බවට ඔහු කරන ප්‍රකාශත් මුලුමනින් ම කුහක ය. පසු ගිය සතියේ දී, ජිනීවා සාකච්ඡා සඳහා එකග වී යන්තම් දින කිහිපයකට පසුව, උතුරේ යාපන අර්ධද්වීපයට පිවිසෙන පටු ගොඩ බිම් තීරුව තුල මුහමලෙයිහි එල්ටීටීඊ මධ්‍යස්ථානවලට තවත් සැලකිය යුතු මට්ටමේ

ප්‍රහාරයක් දියත් කිරීමට මිලිටරිය ප්‍රකෝපකාරී ලෙස පියවර ගත්තේ ය.

ආන්ඩුව මුලින් කියාපෑවේ මිලිටරියේ ක්‍රියාව “ආරක්ෂක” පියවරක් බව යි. මෙය වනාහි පසු ගිය මාස තුන තිස්සේ සිදු කල ආන්ඩුවේ සියලු ප්‍රහාරක මෙහෙයුම් සඳහා යොදාගත් නිල කඩතුරාව යි. මෙම කියාපෑම ඉක්මනින් ම පචයක් බව ඔප්පු විය. මැනවින් සිය බලමුලු තර කර ගෙන සිටි එල්ටීටීඊ සටන්කරුවන් මැදට සොල්දාදුවන් තල්ලු වී යාමත් සමග ප්‍රහාරය ව්‍යසනකාරී පරාජයක් බවට පත් විය. සිදු වූ දරුනු සටන්වලින් 130කට ආසන්න සොල්දාදුවන් සංඛ්‍යාවක් ඝාතනයට ලක්ව 500කට වඩා තුවාල සිදු විය. අනතුරුව මිලිටරියට පසු බැසීමට බල කෙරුනි.

මිය ගිය සොල්දාදුවන්ගෙන් අඩකට වඩා එල්ටීටීඊ ප්‍රදේශ තුල දමා යාමට සිදු විය. එල්ටීටීඊය එම සිරුරු ජාත්‍යන්තර රතු කුරුස කමිටුව හරහා නිල වසයෙන් හමුදාවට භාර දුනි. සටන් විරාමය අධීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) රාජ්‍යතාන්ත්‍රික භාෂාවෙන් සඳහන් කල පරිදි: “කොටි මිය ගිය සොල්දාදුවන් 75කගේ සිරුරු සොයා ගෙන ඇත්නම්, එයින් යෝජනා කෙරෙන්නේ කැරලිකරුවන්ගේ අනතුරු ඇඟවීම් නොතකා, හමුදාව කැරලිකරුවන්ගේ ප්‍රදේශ තුලට නව ප්‍රහාරයක් දියත් කර ඇති බව යි.”

ඒ ගැන කිසිදු තැකීමක් නැතිව, ආන්ඩුව අලුත් කතාවක් ගොතා ඇත: එනම්, ප්‍රහාරයත් එනයින් ගත් කල පරාජයත් සම්බන්ධයෙන් නොහික්මුනු නිලධාරියෙක් වගකිව යුතු බව යි. මේ පිලිබඳ වඩාත් ම විස්තාරනය කෙරුනු කතාන්දරය ඉදිරිපත් කරන ලද්දේ, මිලිටරි අන දෙන නිලධාරී මන්ඩලය සමග සමීප සබඳතා තිබෙන ඉක්බාල් අතාස් විසින් පසු ගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයේ සිය නිතිපතා “තත්ව වාර්තාව” තුල යි. අතාස්ට අනුව, ජනාධිපති හා ජාතික ආරක්ෂක මන්ඩලය මිලිටරියේ ක්‍රියාව ගැන කිසිවක් දැන සිට නැති බවට ඔහුට හොඳ අධිකාරවත් භාවයකින් යුතුව කිය හැක.

“ඇත්ත වසයෙන් ම පසුව පෙනී ගිය පරිදි (මුහමලෙයිහි) මූලික මිලිටරි ප්‍රහාරයක් දියත් කලේ නම්, දේශපාලන නායකත්වය ඒ ගැන මුලුමනින් ම නොදැන සිටියේ ය. එලෙස ම, ප්‍රහාරය ක්‍රියාත්මක නොකරන ලෙස, සිය සේවා කාලය දීර්ඝ කර ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටි අධි උද්යෝගිමත් මිලිටරි නිලධාරියකු පොලඹවාලීමට උත්සාහ ගෙන ඇති, එක් නිලධාරියකු හැරුනු කොට ඉහල පෙලේ නිලධාරීන් ද ඒ ගැන දැන සිටියේ නැත”, යනුවෙන් අතාස් ලිව්වේ ය. ඔහු ලිපිය පුරා එම කරුන කිහිප වතාවක් ම පුනරුච්චාරනය කොට තිබුනි.

කෙසේ වෙතත්, ප්‍රහාරය ප්‍රධාන රහසක් වූයේ නැත. සන්නද්ධ රථවල හා ගුවන් සහයෝගයේ පිටුබලය ලද භටයන් විශාල සංඛ්‍යාවක් සහභාගි වූ ප්‍රහාරය සඳහා යන සූදානම ගැන, ප්‍රහාරයට දින දෙකකට පෙරාතුව, එස්එල්එම්එම් වෙත සිය උත්සුකතා පල කිරීමට එල්ටීටීඊය ක්‍රියා කොට තිබුනි. එල්ටීටීඊයේ අනතුරු ඇඟවීම් දේශීය හා ජාත්‍යන්තර මාධ්‍යවල වාර්තා කරන ලදි. රාජපක්ෂ සහ ආරක්ෂක ප්‍රධානීන් මාධ්‍ය වාර්තා කියවූ නමුත් -- විශේෂයෙන් ම එය එලඹෙන සාම සාකච්ඡාවලට බලපාන බව ඔවුන් දන්නා බැවින් -- ඒ ගැන කිසිදු පියවරක් ගත්තේ නැතැයි කියාපෑම විකාරයකි.

සත්‍යය නම් මෙම දුර්වල කතාව ගොතා ඇත්තේ සිදු වන මූලික අපහසුතාවක් යට ගැසීම පිනිස ය. අතාස් ම සටහන් කරන පරිදි: “අන් සෑම දෙයකටමත් වඩා, දේශපාලන නායකත්වයේ දැනුවත්භාවයක් නැතිව හා ජ්‍යෝෂ්ට නිලධාරීන්ගේ කැමැත්තට එරෙහිව සිදු කල වැරදි ලෙස සැලසුම් කෙරුනු බදාදා මෙහෙයුම මහින්ද රාජපක්ෂ ආන්ඩුව පැහැදිලිව ම අපහසුතාවට පත් කර තිබේ. ජාත්‍යන්තර ප්‍රජාවගේ ඇස් ඉදිරියේ එහි විශ්වාසනීයත්වය ප්‍රශ්නයට බඳුන් කෙරුනි.”

ජිනීවා සාකච්ඡා සඳහා යන සූදානම තුල, ආන්ඩුවේ අප්‍රකාශිත මූලෝපාය වී ඇත්තේ එල්ටීටීඊය හැකි තරම් දුර්වල කිරීම යි. මුහමලෙයි මෙහෙයුම, එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ අල්ලා ගැනීමේ එල්ලයෙන් යුතුව සිදු කල, සාම්පූර් හා මඩකලපු දිස්ත්‍රික්කයේ මෙහෙයුම් ඇතුලු මෙහෙයුම් ගනනාවකින් එකක් පමනි. සාකච්ඡාවලට පෙරාතුව සිය තත්වය ඉහල දමා ගැනීමේ උත්සාහයක් ලෙස එල්ටීටීඊය පෙරලා පහර දීම පුදුමයක් නොවේ.

සඳුදා “නිරායුධ” නාවික භටයන් මරා දැමීම ගැන ආන්ඩුවේ ප්‍රකාශක රඹුක්වැල්ල එල්ටීටීඊය හෙලා දුටුවේ ය. සන්නද්ධ හෝ නිරායුධ නාවික භටයන්ට එල්ල කරන ප්‍රහාරයක්, එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට වග විභාගයක් නැතිව ගුවන් හා කාල තුවක්කු ප්‍රහාර එල්ල කිරීමට වඩා යුක්ති යුක්ත මිලිටරි ඉලක්කයක් වේ. රඹුක්වැල්ල ශිෂ්‍යාවන් ගනනාවක් මරා දමමින් අගෝස්තුවේ දී පාසලකට එල්ල කල ගුවන් හමුදා බෝම්බ ප්‍රහාරයක් ආරක්ෂා කලේ එහි දී මිය ගිය අය “ලමා සොල්දාදුවන්” බවට සාවද්‍ය ප්‍රකාශයක් කරමිනි. එම අවස්ථාවේ එම “ලමා සොල්දාදුවන්” නිරායුධව සිටීම ඔහුට ගැටලුවක් නොවී ය.

එවන් ප්‍රචාර, ජනගහනයේ අති මහත් බහුතරයකට අවශ්‍ය නැති යුද්ධයක් යුක්තියුක්ත කරනු වස් දෙමල විරෝධී උන්මාදනීය වාතාවරනයක් අවුලුවාලීමේ ආන්ඩුවේ ප්‍රයත්නයන්ගේ කොටසකි. ඊයේ ගාල්ලේ එල්ටීටීඊ ප්‍රහාරයෙන් පසුව, සිංහල ස්වෝත්තමවාදී මැර කල්ලි ගල් මුල්වලින් ගසමින් හා දොර ජනෙල්

බිඳිමින්, ප්‍රදේශයේ පිහිටි දෙමල ජනයාට අයත් කඩ සාප්පු ගනනාවකට පහර දුන්හ. "යම් ආකාරයක ප්‍රතිප්‍රහාරයක්" අවුලුවා ගැනීමට උත්සාහ කරන්නේ යැයි රඹුක්වැල්ල එල්ටීටීඊයට බැන වැදුන නමුත් ඔහු සහ ඔහුගේ ආන්ඩුව වර්ගෝත්තමවාදී වාතාවරනය නිර්මානය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වසයෙන් වගකිව යුතු ය.

යුද්ධය සඳහා වඩ වඩා විවෘතව උද්ඝෝසනය කරමින් සිටින, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ඇතුලු සිංහල අන්තවාදී පක්ෂවල සහයෝගය රාජපක්ෂ ආන්ඩුවට ලැබේ. ගාල්ලේ ප්‍රහාරයෙන් පසුව, ජවිපෙ ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ජිනීවා සාකච්ඡාවන්ට නොයන ලෙස යි. "ආන්ඩුව ජිනීවාහි දී සාම සාකච්ඡා යලි ඇරඹීමට යන්නේ නම්, අප අවධාරනය කරන්නේ ඔවුන් එය අත්හැර දැමිය යුතු බව යි." යනුවෙන් ජවිපෙ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශ වාචාල ලෙස ප්‍රකාශ කලේ ය. "ආන්ඩුවේ සාම නියෝජිතයන් වීමට යන අය ජිනීවා යාමට රෙදි මදින එක නතර කිරීමට මේ වන විටත් පරක්කු වැඩියි."

කෙසේ වෙතත්. වඩාත් ම අර්ථහාරී ප්‍රතික්‍රියාව පැමිනියේ බුෂ් පාලනාධිකාරය වෙතිනි. රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රකාශක සීන් මැක්කොර්මැක් සඳුදා හබරන ප්‍රහාරය හෙලා දැක්කේ, එක්සත් ජනපදය "කාලයක් තිස්සේ එල්ටීටීඊය විදේශ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කොට" ඇති බව ප්‍රකාශ කරමින් සහ "එල්ටීටීඊය ත්‍රස්තය යොදා ගැනීම ප්‍රතික්ෂේප කල යුතු" බව අවධාරනය කරමිනි. අඩු ගනනේ ආකාරගත ආකාරයට, වොෂිංටනය තවමත් ඊනියා සාම ක්‍රියාදාමයට පිටුබලය සපයයි. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව ගත් කල, එක්සත් ජනපදය සිට ඇත්තේ, පසු ගිය නොවැම්බරයේ රාජපක්ෂ බලයට පැමිනි අවස්ථාවේ පටන් මේ දක්වා යුද ගැටුම් අඛන්ඩව ඇවිස්සීම නුදුටුවා සේ ය. ඇත්ත වසයෙන් ම, මැක්කොර්මැක්ට පසු ගිය සතියේ මුහමලෙයි මිලිටරි මෙහෙයුම ගැන කීමට කිසිවක් තිබුනේ නැත.

බුෂ් පාලනාධිකාරය රාජපක්ෂ ආන්ඩුවට දෙන නිහඬ සහයෝගය, 2002 සටන් විරාම ගිවිසුම නොතකා හැර එල්ටීටීඊයට එරෙහිව ප්‍රහාරාත්මකට ඉදිරියට යාමට ආන්ඩුව හා මිලිටරිය දිරිමත් කල වැදගත් සාධකයක් වී ඇත.